(ශ)
00240

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2018/2019

**ESD2235/EPD4535 -** පෞරුෂ මනෝ විද්‍යාව

කාලය - පැය තුන (03) යි.

---

දිනය - 2020.10.03 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලු ප්‍රශ්නවලටත් 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටත් (03) පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. "පෞරුෂය" නිර්වචනය කරන්න.

02. ඔබ පෙර පාසල් සිසුන් වෙතින් හඳුනාගත් "පෞරුෂ ගති ලක්ෂණ" දහයක් (10) ලියන්න.

03. පෞරුෂය පිළිබඳ "ගති ලක්ෂණ හා වර්ග" න්‍යායන්හි ප්‍රධාන අදහස් සංසන්දනයක යෙදෙන්න.

04. 'පෞරුෂ අක්‍රමිකතා' යන්න පැහැදිලි කරන්න.

05. පෞරුෂ තක්සේරුකරණය සඳහා භාවිත කළ හැකි ප්‍රධාන ක්‍රම තුනක් සඳහන් කර ඉන් <u>එකක් (01)</u> කෙටියෙන් පැහැදිලි කරන්න.

06. (i) අන්තර්වර්තික පෞරුෂ ගති ලක්ෂණ තුනක් (03) ලියන්න.

    (ii) ඔබ ඉහත සඳහන් කරන ලද එක් (01) ලක්ෂණයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. චර්යාවාදී න්‍යායට අනුව පෞරුෂ සංවර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණාත්මක පර්යාලෝකනයෙන් මතු කෙරෙන මනෝ ලිංගික අවධි නම් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පෙර පාසල් වියේ පසුවන ළමයින් තුළ බහුලව දැකිය හැකි පෞරුෂ අක්‍රමිකතා <u>තුනක් (03)</u> නම් කර ඒ <u>එක් එක්</u> අක්‍රමිකතා දක්වන ළමයින්ගේ චර්යාමය ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ඔබ ඉහත සඳහන් කරන ලද පෞරුෂ අක්‍රමිකතා වලින් පෙළෙන ළමයින්ට උපකාර කළ හැකි පෙර පාසල් ගුරු භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i) සිසුන්ගේ යහපත් පෞරුෂ සංවර්ධනයකට කටයුතු කිරීම ගුරුවරුන්ගේ යුතුකම හා වගකීම වේ. ශිෂ්‍ය පෞරුෂ සංවර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරයෙකු වශයෙන් සංවිධානය කළ හැකි වැඩ සටහන් පහක් **(05)** නම් කරන්න.

(ලකුණු 05)

(ii) සිසුන්ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා ඔබ විසින් ඉහත සඳහන් කරන ලද වැඩ සටහන් තුනකට **(03)** අදාල ක්‍රියාකාරකම් පෙර පාසල තුළ සංවිධානය කරන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 3 x 5 =15)

11. (i) දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි ආරය සහ පරිසරය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) දරුවන්ගේ පෞරුෂ සංවර්ධනයට යෝග්‍ය පරිසරයක් නිවස තුළ ගොඩනගා ගන්නා ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) බහිර්වර්තික පෞරුෂ ගති ලක්ෂණ පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) බහිර්වර්තික පෞරුෂ ගති ලක්ෂණ සිසුන් තුළ වර්ධනය කිරීමෙන් සමාජයට වන යහපත පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) පුද්ගල වෙනස්කම් යනු කුමක්දැයි උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) සමාජ ඉගෙනුම් න්‍යායට අනුව පුද්ගල වෙනස්කම්වලට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 10)

හිමිකම ඇවිරිණි.